**ලංසු ආරාධනය**
**මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය**

**මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හා අදාළ අනෙකුත් දෙපාර්තමේන්තු වෙත පවිත්‍රතා සේවාව සැපයීමට සුදුසු ආයතනයක් තෝරාගැනීම සඳහා ලංසු කැඳවීම - 2026/2027**
**Bid No – MOF/NCB/13/15/2026**

01. කොළඹ 01, ලෝටස් පාරේ පිහිටි බිම් මහල ඇතුලුව මහල් පහකින් සමන්විත මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ප්‍රධාන ගොඩනැගිල්ල හා පහළ බිම් මහල සහ ඉහළ බිම් මහල ඇතුලුව මහල් හතකින් සමන්විත නව මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ගොඩනැගිල්ල සඳහා පිරිසිදු කිරීමේ සේවාව 2026/2027 වර්ෂයන්හි වසරක කාල පරිච්ඡේදයක් (2026.09.01 දින සිට 2027.08.31 දින දක්වා) තුළ පවත්වාගෙන යාම සඳහා **ජාතික තරඟකාරී ලංසු කැඳවීම** යටතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලන ලංසුකරුවන්ගෙන් පමණක් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වෙනුවෙන් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් 2026.06.11 දින සිට 2026.07.02 වැනි දින ප.ව. 02.00 දක්වා, මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ.

මේ සඳහා ඔබ විසින් සපුරාලිය යුතු මූලික සුදුසුකම් පහත පරිදි වේ.

(I) ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ ආඥා පනත යටතේ හෝ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී තිබීම.
(II) රාජ්‍ය/සංස්ථා අංශයේ පිරිසිදු කිරීමේ සේවා සැපයීම සම්බන්ධව අවම වශයෙන් අවුරුදු තුනක පළපුරුද්ද (අවම වශයෙන් එක් ආයතනයක හෝ සේවකයන් 30ක් යොදවා තිබිය යුතුය)
(III) අවම වශයෙන් කම්කරුවන් අසූවකින් (80) සමන්විත කම්කරු කණ්ඩායමක් සිටිය යුතු අතර යටත් පිරිසෙයින් පසුගිය මාස 12 ඇතුළත ඔවුන් වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදලට දායක මුදල් ගෙවනු ලැබූ බව සනාථ කරන ලියවිලි ඉදිරිපත් කළ යුතු ය.

(සැ.යු.:- ඉල්ලුම්පත්‍රය සමඟ ඉහත සුදුසුකම් සපුරා ඇති බවට සාක්ෂි ලේඛන/සහතිකවල සහතික කළ ඡායා පිටපත් අමුණා එවිය යුතුය.)

02. ලංසු කැඳවීමේ ලේඛනයන්හි උපදෙස් ලබා දී ඇති පරිදි ලංසු ඇපකරය හා අනෙකුත් ලියකියවිලි ලංසුව සමඟ ඉදිරිපත් කළ යුතු වේ.

03. මේ සඳහා, ආපසු නොගෙවනු ලබන රු.3,500.00 ක මුදලක් ලේකම්, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ සරප් වෙත ගෙවා ලබා ගන්නා වූ රිසිට්පත සමඟ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් නමින් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් පසු 2026.06.11 දින සිට 2026.07.01 දින දක්වා සතියේ වැඩ කරන දිනයන්හි පෙ.ව. 09.00 සිට ප.ව. 03.00 දක්වා ඉහත ලිපිනයේ පිහිටි මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ නව ගොඩනැගිල්ලේ ඉහළ බිම් මහලේ පිහිටි ගිණුම් අංශයෙන් ලංසු ලියවිලි ලබාගත හැකි ය. එමෙන්ම ඔබට ලංසු ලියවිලි පරික්ෂා කර බැලීමට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහාද ඉහත දිනයන්හි දී එය නොමිලේ පරීක්ෂා කර බැලිය හැකිය.

04. ලංසුකරු ස්වකීය ලංසුව සමඟ රු.300,000.00 ක ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වාණිජ බැංකුවකින් ලබාගත් ලංසු ඇපකරය/බැංකු ඇපකරයක් හෝ ඒ වටිනාකමට ආපසු ගෙවනු ලබන ලංසු තැන්පතු මුදල "මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්" නමින් තැන්පත් කිරීම සඳහා අමාත්‍යාංශයේ ගිණුම් අංශයේ සරප් කවුන්ටරය වෙත එම මුදල ගෙවීම් කර රිසිට්පතක් ලබා ගත යුතු වේ. ලංසු ඇපකරය ලංසු විවෘත කරන දින සිට ලිත් දින එකසිය විස්සක් (120) දක්වා (එනම් 2026.10.30

දින දක්වා) වලංගුව පැවතිය යුතුය.

05. නිසි පරිදි සම්පූර්ණ කරන ලද ලංසු ලේඛන ලංසු භාරගැනීමේ නියමිත වේලාව අවසන් වීමට පෙර මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ නව ගොඩනැගිලේ ඉහළ බිම් මහලේ ගිණුම් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීම හෝ 2026.07.02 දින ප.ව. 02.00 ට පෙර ලැබෙන පරිදි ප්‍රධාන ගණකාධිකාරි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, ලෝටස් පාර, කොළඹ 01 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ හැකිය. මිල ගණන් ඉදිරිපත් කරන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි "මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ පවිත්‍රතා සේවාව පවත්වාගෙන යාම සඳහා සුදුසු ආයතනයක් තෝරා ගැනීම සම්බන්ධයෙන් වන ප්‍රසම්පාදනය - 2026/2027" යනුවෙන් සඳහන් කළ යුතුය.

06. පූර්ව ලංසු සාකච්ඡාවක් 2026.06.22 දින පෙ.ව. 10.30ට මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ගිණුම් අංශයේ දී පැවැත්වේ.

07. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම, එනම් 2026.07.02 දින ප.ව. 02.00ට භාණ්ඩාගාර නව ගොඩනැගිල්ලේ ඉහළ බිම් මහලේ ගිණුම් අංශයේ පැවැත්වීමට නියමිතය. ලංසු විවෘත කරන අවස්ථාවට ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට පමණක් සහභාගි විය හැක.

08. ලංසු කැඳවීමේ ලියකියවිලි පිළිබඳ තවදුරටත් විස්තර අවශ්‍ය නම් ගණකාධිකාරී(සැපයුම්) 011-2484538 / 011-2484600 (Ext. 1430 / 4223) වෙතින් ලබාගත හැක.

සභාපති,
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය,
කොළඹ 01